Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## වැඩ කළමණාකරු (කොන්ත්‍රාත්)/ආධුනික භාෂා පරිවර්තක (කොන්ත්‍රාත්)

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැඩ කළමණාකරු (කොන්ත්‍රාත්) තනතුරක් සඳහා මාස 6ක කාලසීමාවකට යටත්ව සහ ආධුනික භාෂා පරිවර්තක (කොන්ත්‍රාත්) තනතුරක් සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට 2019.07.31 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''වැඩ කළමණාකරු (කොන්ත්‍රාත්)/ආධුනික භාෂා පරිවර්තක (කොන්ත්‍රාත්) තනතුරු සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www. socialservices. gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් :-

1. වැඩ කළමණාකරු (කොන්ත්‍රාත්) - තනතුරු 01

1.1 වයස් සීමාව :

- අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි වීම.

1.2 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :

- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයයන් ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)
- මෝටර් කාර්මික/පරිගණක/ඉලෙක්ට්‍රොනික් යන විෂයය ක්ෂේත්‍රයන්ට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිග නු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හය (06) මට්ටමට නොඅඩු තරාතිරමක වූ ද පාඨමාලා කාලසීමාව මාස 24කට වැඩි වූ ද අදළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදරා සහතික ලබා තිබීම.
- අපේක්ෂිත ප්‍රවීණතාවන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

1.3. බඳවාගැනීමේ ක්‍රමය :

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

1.4 වැටුප් පරිමාණය :-

- නියමිත වැටුප :-

| | | |
|---|---|---|
| මූලික වැටුප | - | රු. 27,654 |
| ගැලපුම් දීමනාව | - | රු. 243 |
| ජීවන වියදම් දීමනාව | - | රු. 7,800 |

1.5 සේවා කොන්දේසි :

මෙම තනතුරට මාස 6ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කෙරේ. ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හිමිකම් නොමැති තනතුරකි.

2. ආධුනික භාෂා පරිවර්තක (කොන්ත්‍රාත්) - තනතුරු 01

2.1 වයස් සීමාව :

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. : 21ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි.

2.2 අධ්‍යාපන සුදුසුකම් :

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

2.3 වෘත්තීය සුදුසුකම් :

- තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

2.4 පළපුරුද්ද :

- තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

2.5 බඳවාගැනීමේ ක්‍රමය :

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2.6. වැටුප් පරිමාණය :
රා. ප. ච. 03/2016 අනුව

- නියමිත වැටුප :-

| | | |
|---|---|---|
| මූලික වැටුප | - | රු. 24,980 |
| ගැලපුම් දීමනාව | - | රු. 3,278 |
| ජීවන වියදම් දීමනාව | - | රු. 7,800 |

2.7. සේවා කොන්දේසි :
මෙම තනතුර සඳහා වසරින් වසර දීර්ඝ කර ගැනීමේ පදනම මත, වර්ෂයක කොන්ත්‍රාත් පදනම මත පත්කෙරේ. ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර

නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හිමිකම් නොමැති තනතුරකි.

**සටහන :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරක හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලීම්කළ යුතුය.

අධ්‍යක්ෂ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
දෙවන මහළ, II අදියර
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

**සමාජ සේවා දෙපාර්තමේන්තුවේ**

*..................තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

1. මුලකුරු සමඟ නම :————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
3. ලිපිනය :————.
4. දුරකථන අංකය :————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :————.
6. උපන් දිනය :————.
7. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

   අවු. :————, මාස :————, දින :————.
8. විවාහක/අවිවාහක බව :————.
9. ස්ත්‍රී/පුරුෂභාවය :————.
10. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) අ.පො.ස. (උසස් පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :

| පාඨමාලාවේ නම | ආයතනය | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. පළපුරුද්ද :

.......................................................
.......................................................
.......................................................

13. උපාධි සහතිකය පිළිබඳ විස්තර (ආධුනික භාෂා පරිවර්තක තනතුර සඳහා පමණක් අදාළ වේ.)

i. උපාධිය :————.
ii. විශ්වවිද්‍යාලය/ආයතනය :————.
iii. උපාධිය වලංගු වන දිනය :————.
iv. සාමාන්‍ය/විශේෂ :————.
v. විෂයය :————.
vi. පන්තිය :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.